# <u>තීර්ථ ප්‍රදර්ශන වසන්තයේ පලමු ප්‍රදර්ශන ත්‍රිත්වය සඳහා ලියැවුනු අභිරක්ෂණ සටහන</u>

සමකාලින සමාජ, සංස්කෘතික සහ දේශපාලනික තත්ව වෙත සංවේදී වෙමින් ඒ මතින් කාංසාමය වේදිත සහිත දෘෂ්‍ය කෘතීන් ගොඩනැගීම මෙන්ම ඒවායෙහි මූලික පෙනුම එතෙක් පැවති කලා කෘතියේ පෙනුමෙන් වෙනස්වීම අනූව දශකයේ ආරම්භ වූ 90' ප්‍රවණතාවයේ දෘෂ්‍ය කෘතින්හි පැහැදිලි ලකුණක් ලෙසට හඳුනාගත හැකිය. වෙනත් ආකාරයකින් කියනවානම් 90' ප්‍රවණතාවයේ ශිල්පීන් ඔවුන්ට ආසන්නම ඉතිහාසයට සහ වර්තමානයට වඩා දේශපාලනික සවිඥානිකත්වයකින් මුහුණ දුන් පිරිසක් බවත් එහිම අනිවාර්‍යය සාධකයක් ලෙසට ඔවුන් ගොඩනැගූ දෘෂ්‍ය කාතියේ පෙනුම වෙනස් වූ බවත්ය.

අනූවේ ප්‍රවනතාවයේ ශිල්පීන් මුහුණ දුන් හෝ සංවේදී වූ ඉහතින් සඳහන් කළ කාංසාමය තත්ව එනම් ඒ වන විට තිබූ සමාජ සංස්කෘතික හෝ දේශපාලනික රෞද්‍රකරණය අද වන විට වඩාත් සංකීරණව ඇත. අනූවේ දශකයේ තිබූ බොහෝ තත්ව මේ වන විට එහි පසු ස්වරූප දක්වා පත්ව ඇතැයි යෝජනා කළ හැකිය. එනම් ඒ වන විට ලාංකේය දකුණෙහි වූ පැහැදිලි පොදු සතුරෙක් වෙනුවට සදාචාරමය වශයෙන් සතුරු කණ්ඩායම් පෙළක් අර්ථගන්වා ගනිමින් සිටී. විශේෂයෙන් 2009 මැයි 18 යනු ලාංකේය සමාජ සංස්කෘතික ඉතිහාසය පරිවර්තන මෙන්ම විපරිවර්තන වලට බඳුන් වූ මෙන්ම එසේ වීම ආරම්භ වූ සංකීර්ණ මොහොතකි.

මෙම අතිශය සංකීර්ණ හා සංක්‍රාන්තික සංස්කෘතික දේශපාලනික මොහොත දෘෂ්‍ය කලා ශිල්පියෙකු ලෙස ඔබ මුහුණ දෙන්නේ කෙසේද? නොමැතිනම් මෙකී සංකීර්ණ තත්වයට ඔබ සංවේදී වෙන්නේ කෙසේද? නැත්නම් ඊට ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද ?යන්න මෙවර ප්‍රදර්ශන වසන්තයේ අභිරක්ෂණ අරමුණ වේ.

මෙම සංක්‍රාන්තික සංස්කෘතික ස්වරූපනය නොමැතිනම් එකහෙලා සංකේතනය නොවූ දේශපාලනික සංස්කෘතියට මුහුන දීමට සංවේදී වීමට හෝ ප්‍රතිචාර දැක්වීමට අපි ඔබට යෝජනා කරන සංකල්පීය තේමාව වන්නේ "සම" ( Skin ) ය. එනම් ඔබගේ දෘෂ්‍ය යෝජනාව සංවිධානය වීම කළ යුතු වන්නේ " Skin " යන පුළුල් සංකල්පය පදනම්වය. වෙනත් විදියකට සඳහන් කරන්නේ නම් කිසියම් තත්වයක හෝ දෙයක මතුපිට, ඉදිරි පෙනුම,මතුපිට ස්වභාවය හෝ පිට වැස්ම ලෙස " Skin" යන්න විග්‍රහ කළ හැකිය.

ස්තුතියි.

අභිරක්ෂන කමිටුව.

ප්‍රදීප් චන්ද්‍රසිරි

ප්‍රසන්න රණබාහු